සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I & II | පැය / மணித்தியாலம் / Hours: 2 |

- සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න
- අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

---

1) කිතුනු අපගේ පූජනීය ග්‍රන්ථය වන ශු. බයිබලය තුල අඩංගු වන්නේ
(1) විවිධ ජන කථා (2) ග්‍රෝතික කතාන්දර (3) දේව වචනය (4) විද්‍යාත්මක කරුණු

2) පුරාණ ගිවිසුමෙහි සඳහන් වන්නේ
(1) ක්‍රිස්තුන් වහන්සේගේ මුල් සභාව පිළිබඳව
(2) ක්‍රිස්තුන් වහන්සේ ඉපදීමට පෙර යුගය පිළිබඳව
(3) ක්‍රිස්තුන් වහන්සේගේ දේව බල ප්‍රකාශන පිළිබඳව
(4) ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය පිළිබඳව

3) හෙබ්‍රෙව් භාෂාවෙන් ''ටෝරා'' යන්නෙහි අර්ථය වන්නේ
(1) සීනයි ගිවිසුම (2) ගණන් කථාව (3) පංච පුස්තකය (4) ලෙවි ව්‍යවස්ථාව

4) උත්පත්ති පොතේ ඇතුළත් කරුණක් වන්නේ
(1) නෝවා හා ජලගැල්ම
(2) මෝසස්ගේ දූත මෙහෙවර
(3) දස පනත ලබා දීම
(4) පොරොන්දු දේශයට යාම

5) ශු මතෙව් තුමාගේ ශුභාරංචි ග්‍රන්ථයේ සංකේතය වන්නේ
(1) ගවයා (2) රාජාලියා (3) සිංහයා (4) මිනිසා

6) පේදුරු තුමාගේ භාෂා පරිවර්තක ලෙස කටයුතු කර ඇති ශුභාරංචි කතුවරයා වන්නේ
(1) ශු මතෙව් තුමා (2) ශු ලූක් තුමා (3) ශු මාක් තුමා (4) ශු ජොහන් තුමා

7) ශුභාරංචි ග්‍රන්ථයක් ලියන ලද එකම ''අන්‍ය ජාතිකයා වන්නේ''
(1) ශු ලූක් තුමා (2) ශු මතෙව් තුමා (3) ශු ජොහන් තුමා (4) ශු මාක් තුමා

8) ''ගොඩබිමට පොළොව කියා ද ජලයට සාගරය කියාද උන්වහන්සේ නම් තැබූ සේක'' එය කී වෙනි දවසට සම්බන්ධද?
(1) පළමු දවස (2) දෙවන දවස (3) තුන්වන දවස (4) හතරවන දවස

9) ශු බයිබලයේ දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව සඳහන් වන දින ගණන වන්නේ
(1) දින 5කි (2) දින 9කි (3) දින 6කි (4) දින 8කි

10) දෙවියන් වහන්සේ මිනිසාට මේ ලෝකය භාර දෙන ලද්දේ
(1) මැවිල්ල වර්ධනය කිරීමට (2) වනාන්තර විනාශ කිරීමට
(3) ජලය දූෂණය කිරීමට (4) පරිසරය විනාශ කිරීමට

11) දෙවියන් වහන්සේ මිනිසා මවා ''එය ඉතා මනහර'' බව පැවසුයේ
(1) මිනිසා මැවීමත් සමඟ දේව මැවිල්ල සම්පූර්ණ වූ බව නිසයි
(2) සතුන්ට වඩා මිනිසා ලස්සන නිසයි
(3) මිනිසාට කථා කල හැකි නිසයි
(4) පක්ෂීන්ට මෙන් පියාඹන්න නොහැකි නිසයි

12) ''විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගලම් වේ'' ස්වාමින් වහන්සේ ඔබ සමඟය'' මෙය ප්‍රකාශ කරන ලද්දේ
(1) මරිය තුමියටය (2) එළසබෙත් තුමියටය (3) බර්නදෙත් තුමියටය (4) මරිය මග්දලේනාටය

13) ජේසුස් වහන්සේ උපත ලැබුවේ කොහේ දී ද?
(1) ගලීල නුවරදී (2) නාසරෙත් නුවරදී (3) බෙත්ලෙහෙම් නුවරදී (4) දාවිත්ගේ නුවරදී

14) 2018 / 2019 වසර ශු සභාව නම් කර ඇත්තේ
1 ජුසේවාස් පිය වසර 2 දිව්‍යසත්ප්‍රසාදීය වසර
3 යහපත් එඬේරාණන්ගේ වසර 4 පවුල් වසර

15) චතාරික සමය ආරම්භ වන්නේ
(1) ගොබ් ඉරිදා ය (2) මහා බ්‍රහස්පතින්දා ය (3) අළු බදාදා ය (4) මහා සිකුරාදා ය

16) ක්‍රිස්තුන් වහන්සේගේ ''මාංශගත වීමේ අභිරහස '' අප සිහිපත් කරන යාච්ඤාව වන්නේ
(1) නමෝ මරිය (2) ස්වාමිවාක් ආරාධනය (3) තුන්කාල ආරාධනය (4) රාත්‍රී ආරාධනය

17) කුළුඳුල් පිරිමි දරුවන් සමිඳාණන් වහන්සේට කැප කිරීම සඳහා පුද කරන සතුන් නම්
(1) ගවයන් (2) කොබෙයියන් (3) වී කුරුල්ලන් (4) ගිරවුන්

18) චතාරික කාලය තුල කතෝලිකයන් සිදු කරන භක්ති අභ්‍යාසය වන්නේ
(1) නුවාන පැවැත්වීම (2) ජපමාල උච්චාරණය (3) පාද නමස්කාරය යාම (4) ශු පැය පැවැත්වීම

19) ජේසුස් වහන්සේ ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් ද දෙවියන් වහන්සේගෙන් ද මිනිසුන්ගේ ප්‍රසාදය ලබමින් වැඩුණු සේක යනුවෙන් සඳහන් කරන්නේ
(1) පේදුරු තුමා (2) පාවුලු තුමා (3) ලූක් තුමා (4) ජොහන් තුමා

20) ''ඔබ මා සෙව්වේ මන්ද පියාණන්ගේ මැදුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නහුද? යන ප්‍රකාශය කියන ලද්දේ
(1) පඬිවරුන්ට (2) සිමියොන් දිවැසිවරයාට (3) මරියතුමීට හා ජුසේ තුමාට (4) දේව දූතයන්ට

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුලු ප්‍රශ්න 04ට පිළිතුරු ලියන්න**

01 ශුද්ධ වු බයිබලය ආශ්‍රිතව කරන ලද ක්‍රියාකාරකම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. පැරණි ගිවිසුමට අයත් ග්‍රන්ථ 02 ක් ලියන්න (ලකුණු 2)
2. නව ගිවිසුමෙහි අඩංගු ලිපි 02ක් ලියන්න (ලකුණු 4)
3. පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් 02ක් ලියන්න (ලකුණු 2)
4 .දෙවියන් වහන්සේ මිනිසාට පැවරු වගකීම් 02ක් ලියන්න (ලකුණු 4)
5. ජුදා ජාතීන්ගේ චාරිත්‍ර 02ක් ලියන්න (ලකුණු 4)

(ල 16)

02

1. පුරාණ ගිවිසුම හා නව ගිවිසුමෙහි පොත් ගණන ලියන්න
2. පංච පුස්තකයට අඩංගු පොත් 03ක් ලියන්න
3.උත්පත්ති පොතේ අඩංගු කරුණු 03ක් කෙටියෙන් පැහැදිලි කරන්න (2+3+6=11)

03

1 .5 වන දින දෙවියන් වහන්සේගේ මැවු මැවිලි 02ක් සඳහන් කරන්න
2. දෙවියන් වහන්සේ මිනිසාට පැවරු වගකීම් 03ක් ලියන්න
3 .මැවිල්ල සුරැකීමට ඔබට කළහැකි දේවල් 03ක් විස්තර කරන්න (2+3+6=11)

04 1 දේව මැවිල්ල ඔබ ප්‍රයෝජනයට ගන්නා ආකාර 02ක් ලියන්න
2 මිනිසා අන් මැවිලිවලිට වඩා උසස් වීමට හේතු 03ක් ලියන්න
3 අපි සියලු දෙනාම එකිනෙකාට ගරුකළ යුතුයි හේතු 03ක් පැහැදිලි කරන්න (2+3+6=11)

05

1. ජාතික හා ආගමික චාරිත්‍ර 02ක් සඳහන් කරන්න
2 අප චාරිත්‍ර වාරිත්‍ර වලට ගරු කරන අවස්ථා 03ක් ලියන්න
3. පාසල තුල කිතුනු දරුවෙකු ලෙස සුහදතාව හා සහජීවනයෙන් ක්‍රියා කිරීමට ඔබ ගන්නා පියවර 03ක් ලියන්න (2+3+6=11)

06

1.ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 02ක් ලියන්න
2.ළමාවියේ ජේසුස් වහන්සේ වැඩුණු ආකාර 03ක් ලියන්න
3. වර්තමාන සමාජය තුළ ඔබ කෙසේ වැඩිය යුතුදැයි ආකාර 03ක් පැහැදිලි කරන්න

(2+3+6=11)

07

1.චතාරික කාලය තුළ ඔබට කළ හැකි මර්දන ක්‍රියාවල් 02ක ලියන්න
2.ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 03ක ලියන්න
3.චතාරික කාලය තුළ අසරණ මිතුරියකට/ මිතුරෙකුට උදව් කළ හැකි දේවල් 03ක් ලියන්න

(2+3+6=11)